# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,757--1959 ජූනි 1 වැනි සඳුද —1.6.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1946 ලංකා පාර්ලිමේන්තු මැතිවරණ පිළිබඳ රාජසභා නියෝගය

#### ඡන්දදායක නාමලේඛන සංශොධනය කිරීම—1959

1949යේ අංක 48, 1956යේ අංක 16 සහ 1959යේ අංක 11 දරණ පනත්වලින් සංශොධිත වූ 1946යේ ලංකා පාර්ලිමේන්තු මැතිවරණ පිළිබඳ රාජසභා නියෝගයේ 16 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම්දෙනු ලබන්නේ, 1959 වර්ෂය සඳහා ඡන්දදායක නාමලේඛන සංශොධනය කිරීම ආරම්භකර ඇති බවය.

2. දැනට වලංගුව භාවිතාවන ඡන්දදායක නාමලේඛනවල පිටපත් හෝ ඒවායේ කොටස් හෝ මහා ජනයාට බලාගැනීම පිණිස ලියාපදිංචි කිරීමේ නිළධාරීන් විසින් පහත සඳහන් කාර්යාලවල ප්‍රදර්ශනය කරවනු ලැබේ :—

| නාමලේඛන හෝ ඒවායේ කොටස් හෝ ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල | ප්‍රදර්ශනය කරවනු ලබන නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල විස්තර |
|---|---|
| (1) රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ කාර්යාලය ... ... | අංක 1—උතුරු කොළඹ, අංක 2—මැද කොළඹ, අංක 3—දකුණු කොළඹ සහ අංක 4—වැල්ලවත්ත-ගල්කිස්ස යන මැතිවරණ දිස්ත්‍රික්කවලට අයත් නාමලේඛනවල සම්පූර්ණ පිටපත් |
| (2) කච්චේරිය ... ... ... ... | අංක 1—උතුරු කොළඹ, අංක 2—මැද කොළඹ, අංක 3—දකුණු කොළඹ සහ අංක 4—වැල්ලවත්ත-ගල්කිස්ස යන මැතිවරණ දිස්ත්‍රික්කවලට අයත් නාමලේඛනයන් හැර, ඒ ඒ දිසාපතිතුමාගේ පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි සියළුම මැතිවරණ දිස්ත්‍රික්කවලට අයත් නාමලේඛනවල සම්පූර්ණ පිටපත් |
| (3) එක් එක් ප්‍රාදෙශික බලමණ්ඩල කාර්යාලය ... ... | ඒ ඒ ප්‍රාදෙශික බල මණ්ඩලයට අයත් ප්‍රදෙශය තුළ සිටින සියළුම ඡන්ද දායකයන්ගේ නම් ඇතුළත් නාමලේඛනයේ කොටස |
| (4) එක් එක් ගම් මුලාදෑනිතැනගේ කාර්යාලය ... ... (කච්චේරියක් පිහිටා ඇති නගරයක් තුළ සහ අංක 1—උතුරු කොළඹ, අංක 2—මැද කොළඹ, අංක 3—දකුණු කොළඹ සහ අංක 4 වැල්ලවත්ත-ගල්කිස්ස යන මැතිවරණ දිස්ත්‍රික්කයන් තුළ පිහිටා ඇති ගම්මුලාදෑනි කාර්යාලයන් හැර) | ඒ ඒ ගම්මුලාදෑනි කොට්ඨාශය තුළ සිටින සියළුම ඡන්දදායක අංකයන්ගේ නම් ඇතුළත් නාමලේඛනයේ කොටස |

3. අංක 1—උතුරු කොළඹ, අංක 2—මැද කොළඹ, අංක 3—දකුණු කොළඹ සහ අංක 4—වැල්ලවත්ත-ගල්කිස්ස යන මැතිවරණ දිස්ත්‍රික්කවල ඡන්දදායකයකු වීමට සුදුසුකම් ඇති සෑම දෙනෙකුටම රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගේ කාර්යාලයේදී ඡන්දදායක නාමලේඛනය හෝ ප්‍රාදෙශික බලමණ්ඩල කාර්යාලයකදී එකී ප්‍රාදෙශික බල මණ්ඩලයට අදාල නාමලේඛනයේ කොටස හෝ කාර්යාල වේලාවන් තුළ ඕනෑම වේලාවක පරීක්ෂාකර බලා තමාගේ නම එහි ඇතුළත්වී තිබේ දැයි සැකහැර බලාගත හැකිවන අතර, අනිත් යම්කිසි මැතිවරණ දිස්ත්‍රික්කයක ඡන්දදායකයකු වීමට සුදුසුකම් ඇති සෑම දෙනෙකුටම ඊට අදාල කච්චේරියේදී ඡන්දදායක නාමලේඛනය හෝ ප්‍රාදෙශික බලමණ්ඩල කාර්යාලයේදී හෝ ගම්මුලාදෑනි කාර්යාලයේදී නාමලේඛනයේ එකී ප්‍රදෙශයන්ට අදාල කොටස් හෝ පරීක්ෂාකර බලා තමාගේ නම එහි ඇතුළත්වී තිබේ දැයි සැක හැර බලාගත හැක.

4. ඡන්දදායක නාමලේඛන හෝ එහි කොටසක් පරීක්ෂාකර බැලීමේදී තමාගේ නම එහි ඇතුළත්වී නැති බව පෙනී ගියහොත් එසේ නම ඇතුළත්වී නැති සෑම දෙනෙකු විසින්ම තම තමන්ගේ නම් නියමිත නාමලේඛනයේ ඇතුළත් කිරීම සලකා බැලීම සඳහා මෙහි පහත සඳහන් පරිදි ඉල්ලුම් කළ යුතු වේ :—

(ඒ) අංක 1—උතුරු කොළඹ, අංක 2—මැද කොළඹ, අංක 3—දකුණු කොළඹ සහ අංක 4—වැල්ලවත්ත-ගල්කිස්ස යන මැතිවරණ දිස්ත්‍රික්ක සම්බන්ධයෙන්—

(1) 1959 ජූනි 29 වැනි දින හෝ ඊට පෙර මෙම දැන්වීමට යාකොට ඇති ආකෘතියට අනුව ලියන ලද ඉල්ලුම්පත්‍රයක් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත ඉදිරිපත් කිරීම ;

(2) ලියාපදිංචිකිරීමේ නිළධාරිතැන විසින් තමා වෙත එවනු ලබන යම්කිසි විශෙෂ පෝරමයක ඡන්දදායකයකු වශයෙන් ලියාපදිංචි වීමට තමාගේ ඇති සුදුසුකම් පිළිබඳ විස්තර සැපයීම හා මෙම වර්ෂයේ නාමලේඛන සංශොධනය කිරීම සම්බන්ධයෙන් ඡන්ද දායකයන් වශයෙන් සුදුසුකම් ඇති අයගේ නම් සහ නුසුදුසුවූ හෝ මියගිය අයගේ නම් ගැන විමසා බලා ගණන් ගැනීම සඳහා සෑම ගෙයක් පාසාම පැමිණෙන ගණන් ගැනීමේ නිළධාරීන්ට ඡන්දදායකයකු වශයෙන් තමාගේ ඇති සුදුසුකම් පිළිබඳ ඉහත කී අන්දමේ තොරතුරු සැපයීමද කළයුතු වේ.

1381—ජේ. ඇන්. ආර් 2242—4,900 (5/59)

(ඕ) අනික් ඕනෑම මැතිවරණ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන්—

(1) ලියාපදිංචි කිරීමේ නිළධාරිතැන විසින් තමා වෙත එවනු ලබන යම්කිසි විශෙෂ පෝරමයක ඡන්දදායකයකු වශයෙන් ලියාපදිංචි වීමට තමාගේ ඇති සුදුසුකම් පිළිබඳ විස්තර සැපයීම හා 1959 ජුනි 29 වැනි දින හෝ ඊට පෙර තමාගේ ප්‍රදේශයේ ගම්මුළාදැනි තැන හමුව, ඡන්දදායකයකු වශයෙන් තමාගේ ඇති සුදුසුකම් පිළිබඳ ඉහතකී අන්දමේ තොරතුරු සැපයීම : සහ

(2) 1959 ජුනි මස 29 වැනි දින හෝ ඊට පෙර මෙම දැන්වීමට යා කොට ඇති ආකෘතියට අනුව ලියන ලද ඉල්ලුම්පත්‍රයක් තම ප්‍රදේශයේ ආදායම් නිළධාරිතුමා වෙත ඉදිරිපත් කිරීමද කළ යුතු වේ.

5. ඉල්ලුම්පත්‍ර ආකෘතියේ පිටපත්, නාමලේඛන හෝ ඒවායේ කොටස් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම කාර්යාලයකින් ලබාගත හැක.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්තැන.

1959 මැයි 30 වැනි දින,
කොළඹ.

**1959 වර්ෂයට ඡන්දදායකයකු වශයෙන් ලියාපදිංචිවීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍ර ආකෘතිය**

රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා :..............................................................................

ප්‍රාදෙශීය ආදායම් නිළධාරිතුමා :..............................................................................

............................................................................................................................................ වන මං,

.............................................................................................................. මැතිවරණ දිස්ත්‍රික්කයේ ඡන්දදායකයකු වශයෙන්

ලියා පදිංචි කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

මගේ ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සපයා ඇත :—

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) වයස :————.

(4) මැතිවරණ දිස්ත්‍රික්කය තුළ පදිංචියට පැමිණි දිනය :————.

(5) එහි පදිංචිව සිටි කාලය :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී